සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අනාවරණ පරීක්ෂණය 2021

08 ශ්‍රේණිය **ක්‍රිස්තු ධර්මය** කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මිනිසා දේව මැවිල්ලේ

    (1) අයිතිකරුය (2) භාරකරුය

    (3) උරුමක්කරුය (4) නිර්මාණකරුය

02. මැවීම පිළිබඳ බයිබලේ සඳහන් වන පොත වන්නේ,

    (1) උත්පත්තිය (2) නික්මයාමය (3) ලූක් ය (4) ගණන් කථාවය

03. ''සර්පයා'' ගෙන් සංකේතවත් වන්නේ,

    (1) යහපතය (2) නපුරය (3) පාපයය (4) හොඳ නරකය

04. ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහලුන් ලෙස සිටියේ කුමන රජු යටතේද?

    (1) පාවුල් ය (2) සලමොන් ය

    (3) පාරාවෝ ය (4) දාවිත් ය

05. ''තිබේරියත් මුහුද '' හඳුන්වන තවත් නමක් වන්නේ

    (1) රතු මුහුදය (2) ගලීල මුහුදය

    (3) කළු මුහුදය (4) මධ්‍යධරණී මුහුදය

06. උත්ථාන වූ ජේසුස් වහන්සේගේ ඇණ කැළැල් දැක විශ්වාස කල ගෝලයා වන්නේ

    (1) පේදුරුය (2) ජොහන් ය (3) මතෙව්ය (4) තෝමස්ය

07. ''ජේසුගේ ප්‍රේමේ - විශාල පුදුමය වේ'' ගීතිකාව නිර්මාණය කළේ

    (1) එලිසා ඇග්නිවිය (2) ජොයිස්ද සිල්වාය

    (3) මයිකල් රොඩ්‍රිගු පියතුමාය (4) මර්සලින් ජයකොඩි පියතුමාය

08. ''ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය'' යනුවෙන් පැවසූ ගෝලයා වන්නේ,

    (1) පිලිප් ය (2) යොහන්ය

    (3) පේදුරුය (4) මතෙව් ය

09. ශුද්ධාත්ම ඵල පමණක් අඩංගු වන්නේ,

    (1) සාමය හා යාච්ඤාවයි (2) ප්‍රීතිය හා දිවැස්වැකි කීමයි

    (3) ප්‍රේමය හා ප්‍රීතියයි (4) සාමය හා යාච්ඤාවයි.

10. දරුවෙකු දෙවියන් වහන්සේ පිළිබඳ ප්‍රථම අත්දැකීම ලබන්නේ

(1) පාසලේ දීය (2) පෙර පාසලේදීය (3) දේවස්ථානයේදීය (4) නිවසේදීය

11. ''සුදු අම්මා'' යන නාමයෙන් විරුදාවලිය ලබන්නේ

(1) එලිසා ඇග්නිච්ය (2) ජොයිස්ද සිල්වාය

(3) ඉව්ලින්කානිය (4) තෙරේසා මව්තුමි යය

12. පව්කරුවා නොව පාපය ප්‍රතික්ෂේප කලයුතු බව ජේසුතුමා පෙන්වා දුන් කථා 2 ක් වන්නේ,

(1) මතෙව් හා අංශභාග රෝගියාය (2) සාකෙවුස් හා අන්ධ මිනිසාය

(3) පව්කාරියට ගල් ගැසීම හා අන්ධ මිනිසාය (4) සාකෙවුස් හා පව්කාරියට ගල් ගැසීමය

13. ''මා පවිත්‍ර කරන්න ඔබට පුළුවනැයි'' යනුවෙන් ඉල්ලීම් කළේ කුමන රෝගියෙක් ද?

(1) අංශභාග රෝගියාය (2) අන්ධ මිනිසාය

(3) ලාදුරු රෝගියාය (4) කුෂ්ට රෝගියා ය

14. ගොවිජනතාව හා අනන්‍යතාවක් ඇතිකරගනිමින් සමාජ මෙහෙවරෙහි යෙදුන පියතුමකු වන්නේ,

(1) සෝමසිරි කුමාරදාස් පෙරේරා පියතුමාය. (2) ඩොනල්ඩ් කනගරත්නම් අනුනායක තුමාය.

(3) මයිකල් රොද්‍රිගු පියතුමාය. (4) සැමුවෙල් සෙල්වරත්නම් තුමාය.

15. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමට අයත් පොත් ගණන වන්නේ

(1) විසි හතක්ය (2) තිස්නවයක් ය

(3) හතලිස් හයක් ය (4) හැට හයක් ය

16. ආදි පීතෘවරු ජීවත් වූ කාලය අයත් වන්නේ

(1) ක්‍රි.පූ 2000 - 1700 ය (2) ක්‍රි.පූ 2000 - 1600 ය

(3) ක්‍රි.පූ 1100 - 1700 ය (4) ක්‍රි.පූ 2000 - 1500 ය

17. පැරණි ගිවිසුම තුළ සඳහන් ප්‍රබල කාන්තා චරිතය වන්නේ,

(1) රූත්ය (2) එස්රාය

(3) දෙබෝරා ය (4) සාරා ය

18. බබිලෝනියේ රජ වූ අර්තක්ෂස්තාරජු යටතේ සේවය කළ උසස් නිලධාරියා වන්නේ,

(1) ගිඩියොන් ය (2) නෙහෙමියා ය

(3) සෙරුබ්බාබෙල් ය (4) එස්රාය

19. කුඩාකල සිට ආගමික පරිසරයක් තුළ හැදී වැඩුණු දිවැසිවරයා වන්නේ,

(1) යොසායාය (2) ආමොස්ය

(3) එසකියෙල්ය (4) ජෙරමියාය

20. මිනිසා මැවීම හා පාපයට වැටීම අඩංගු වන්නේ බයිබලයේ කුමන පොතේද?

(1) නික්මයාමය (2) උත්පත්තිය

(3) ලෙවී ව්‍යවස්ථාවය (4) ගණන් කථාවය

(ලකුණු 2 x20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) දෙවියන්වහන්සේ ස්ත්‍රියට දුන් දඬුවම් 2 ක් ලියන්න.

(ii) ඊශ්‍රායෙල් ජනතාව මිසරයේදී කල වහල් වැඩ 2 ක් ලියන්න.

(iii) කිතුණු දරුවකු සතු යහපත් ගුණාංග 2 ක් ලියන්න.

(iv) ධර්මදූත සේවය යාමට පෙර ගෝලයන්ට දුන් උපදෙස් 2 ක් ලියන්න.

(v) ශුද්ධාත්ම දීමනා 2 ක් ලියන්න.

(vi) ශ්‍රී ලාංකික ජන ජීවිත ගොඩ නැංවීම උදෙසා ක්‍රියාකල පියතුමන්ලා 2කු ලියන්න.

(vii) ආදිපීතෘවරුන් 2කු ලියන්න.

(viii) විපුවාසයෙන් මිදී සිය දේශයේ පදිංචි වූ ඉශ්‍රායෙල් ජවතාවට නායකත්වය ලබාදුන් 2කු ලියන්න.

(ල. 2 x 8 = 16)

02. (i) ඊශ්‍රායෙල් ජනයාගේ වර්ධනය මර්ධනය කිරීමට පාරාවෝ ගත් ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ල. 02)

(ii) පාරාවෝගෙන් මිදී පොරොන්දු දේශය කරා ගමන් කිරීමේදී දෙවිදුන්ගෙන් පෝෂණය ලැබූ අවස්ථා 3 ක් ලියන්න. (ල. 03)

(iii) වර්තමාන මිනිසා වහල්වී සිටින දේවල් 3 ක් නම් කර ඒවායෙන් මිදීමට ඔබ කරන යෝජනා 03 ක් ලියන්න. (ල. 06)

03. (i) දේව කැඳවීම යනු කුමක්දැයි ලියන්න. (ල. 02)

(ii) ජේසුස් වහන්සේ මුලින්ම කැඳවූ ගෝලයන් 03 දෙනෙකු ලියන්න. (ල. 03)

(iii) ඔබට දේව කැඳවීමක් ලැබුනොත් ඔබ ක්‍රියාකරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

04. (i) ජෙරමියා යන නමෙහි අර්ථය ලියන්න. (ල. 02)

(ii) දිවැසිවර කැඳවීමේ ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(iii) ජෙරමියා දිවැසි වරයා මෙන් යහපත් සමාජයක් ගොඩ නැගීමට දායක වන අපට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 3 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

05. (i) දෙවියන්වහන්සේගේ කැඳවීම ලත් ප්‍රථම ආදි පීතෘවරයා වන්නේ කවුරුන්දැයි ලියන්න. (ල. 02)

(ii) ඔහුට දෙවියන් වහන්සේගෙන් ලැබුණු පොරොන්දු තුන මොනවාද? (ල. 03)

(iii) ජාකොබ් හා ඒසව් සමගි වීමේ සිද්ධියෙන් අපට ලැබෙන මඟ පෙන්වීම් 3 ක් ලියන්න. (ල. 06)

06. (i) ශුද්ධ වූ බයිබලය බෙදා දක්වෙන ප්‍රධාන කොටස් 2 ලියන්න. (ල. 02)

(ii) පංච පුස්තකයට අයත් පොත් 3 ක් ලියන්න. (ල. 03)

(iii) හතරවන දේව පනත ලියා එම පනත සුරැකීමට කිතුණු අප කලයුතු දේවල් 3 ක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 1 ) | 03. ( 2 ) | 04. ( 3 ) | 05. ( 2 ) | 06. ( 4 ) | 07. ( 2 ) | 08. ( 3 ) | 09. ( 3 ) | 10. ( 4 ) |
| 11. ( 3 ) | 12. ( 4 ) | 13. ( 3 ) | 14. ( 3 ) | 15. ( 2 ) | 16. ( 1 ) | 17. ( 3 ) | 18. ( 2 ) | 19. ( 4 ) | 20. ( 2 ) |

## II කොටස

01. (i) සැමියාගේ පාලනයට නතු කිරීම, දරුවන් ප්‍රසූත කිරීමේදී විළිරුදාව ඇතිවීම
(ii) ගඩොල් කර්මාන්තය, නගර ඉදිකිරීම
(iii) ඉවසීම, ප්‍රේමය
(iv) මල්ලක්වත් කමිස දෙකක් වත්, පාවහන් සගලක්වත් හෝ සැරයටියක්වත් රැගෙන නොයන ලෙස
(v) අන්භාෂා පහදා දීමේ හැකියාව, දිව්‍යස් වැකි කීමේ බලය
(vi) මයිකල් රොද්‍රිගු පියතුමා, සේවක සැමුවෙල් සෙල්වරත්නම්තුමා
(vii) ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්
(viii) එස්රා, නෙහෙමියා (ල. 2 x 8 = 16)

02. (i) බර වැඩ ගැනීම, නගර ඉදිකිරීමට යොදාගැනීම. (ල. 02)
(ii) ආහාර ලබා දීම, ජලය ලබා දීම, දිවා හා රාත්‍රියට ආලෝකය ලබාදීම. (ල. 03)
(iii) සිසුන් ලියා ඇති පිළිතුරු බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

03. (i) දේව මෙහෙවරෙහි විශේෂ කාර්යයන් උදෙසා දෙවියන් වහන්සේගේ තෝරා ගැනීමයි. (ල. 03)
(ii) පේදුරු, යාකොබ්, ජොහාන් (ල. 03)
(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

04. (i) දෙවියන් වහන්සේ විසින් ඔසවා ගනු ලැබීම. (ල. 03)
(ii) කැඳවීම, තම නොහැකියාවන් ඉදිරිපත් කිරීම, සමිඳුන් විසින් ධෛර්යවත් කිරීම, සේවය සඳහා යොමු කිරීම. (ල. 03)
(iii) තමා ජීවත්වන සමාජය පිළිබඳ මනා අවබෝධයකින් ක්‍රියාකිරීම
එම සමාජයේ යහපත් හා අයහපත් ලක්ෂණ හඳුනා ගැනීම.
එම අයහපත් ක්‍රියාවන්ට විරුද්ධව ප්‍රතිචාර දැක්වීම.
දෙවියන්වහන්සේගේ හඬට අවනතව දේව අභිමතයක් ඉටු කිරීම.
ආදි දේවල් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) ආබ්‍රහම් (ල. 02)
(ii) ජීවත්වීඹට දේශයක් හිමිකර දෙන බව
මහත් ජාතියක් ඇතිකරදෙන බව
නාමය මුළු පොළොවේම සෙනඟට ආශිර්වාදිත නාමයක් වන බව (ල. 03)
(iii) අප අතින් සිදුවන වැරදි පිළිගැනීමට සූදානම් වීම.
සහෝදර සහෝදරියන්ට ගරු කිරීම.
සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් සමාව අයැදීම හා සමාව දීම.
පරිත්‍යාගශීලීව කටයුතු කිරීම.
සහෝදර ප්‍රේමයෙන් කටයුතු කිරීම. (ල. 06)

06. (i) පැරැණි ගිවිසුම හා නව ගිවිසුම (ල. 03)
(ii) උත්පත්ති , නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව, ද්විතීය නීති සංග්‍රහය ආදියෙන් 03 ක් ලියා ඇත්නම් ලබා දෙන්න. (ල. 03)
(iii) සබත් දවස ශුද්ධ ලෙස ගත කරන්න.
ඉරු දින නොකඩවා දේව නමස්කාරයට සහභාගී වීම.
ඉරුදින දේව මෙහෙය අතපසු කර බාහිර ක්‍රියාවල යෙදීමෙන් වැළකීම.
දේව මහිමය උදෙසා කටයුතු කිරීම.
අන් අයගේ යහපත උදෙසා සබත් දිනය වැය කිරීම.
රෝගීන් බැලීමට යාම ආදි ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)